# පීඨ ජාතකය

තවද සමන්ත චක්ෂු වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසක කුලයට නින්දා කළ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ සැවැත්නුවරට අවුත් මේ නුවර යහපත්ව දන්දෙන්නේ කවුදැයි විචාළසේක. මේ නුවර යහපත්ව දන්දෙන්නෝ සුලු අනේ පිඬු මහසිටානෝය. විශාඛාවෝය, මල්ලිකාදේවියයි කීහ,

ඒ අසා පාන්වූ ගමනේ සිඟාගියතෙන කවුරුත් පාත්‍රය අරනොගත්තුය. නුවර මුළුල්ලේ ඇවිදගණ යට එනකලට වහන්දෑ කැඳ වළඳපුසේක. භික්ෂූන් වහන්සේ නිදානැගිට සිඟාගිය හෙයින් කැඳවළඳනට නුවුනේය. දවාලට බත් සිඟායයි දෙවනුව ගිය ගමනෙත් නො වෙලා හෙයින් පාත්‍රය ගත් කෙනෙක් නැත. ගණයේ උන් වහන්දෑ භික්ෂූන් වහන්සේ සිඟාගොස් එන කලට බත් වළඳපුසේක. නුවරින් බත් සිඟන්ටවත් නොවි ගණයෙන් වළඳන්ටවත් නොවි භික්ෂූන් වහන්සේ සුන්බත්ව කියනසේක් මේ නුවර උපාසකවරු යහපත්ව දන්දෙති, කී පසණක් විනා දද්දෙන කෙනෙකුන් නුදුටුවා සේ නින්දා කියමින් උන්සේක. සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා මහණෙනි, භික්ෂූහු නම් බඹරුන් කුසුමයේ රොන් ගත්තාසේ උපාසකරුන්ගේ සිත් නො මිරිකා දන්ගත්තොත් විනා අක්‍රෝශ පරිභව හා නින්දා කිරීම් තපස් වීන්ට යෝග්‍ය නොවෙයි, පෙර මහොත්තමයෝ පවා දන්දුන් උපාසකවරුන්ට යෝග්‍ය නොකළෝවේදැයි වදාරා හේ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්ව වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ වනාන්තරයට වැඩ ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව වාසය කරණ කල්හි බරණැස් නුවරට අවුත් මේ නුවර යහපත්ව දන්දෙනෝ කවුරුදැයි විචාළකල්හි මේ නුවර අසවල්තෙන සිටානෝ යහපත්ව දන්දෙති අසා එසේ වී නම් උන්ගේ දොරට යම්හයි සිඟා වැඩිසේක. උන්වහන්සේ සිඟාවඩිනට පළමුවෙන් සිටානෝ රජ්ජුරුවන් වහන්සේට රාජ්‍යසේවයට පලාගියහ. බෝධිසත්වයෝ සිටානන්ගේ දොරකඩ නැතක්වේලා සිඟා සිටි කල්හි සිටානන්ගේ ගෙයින් කවුරුත් නුදුටුවාහ. බෝධිසත්වයෝ සිට වෙහෙසී නික්මුනාහ.

සිටානෝ රාජ්‍යසේවය කොට ගෙට එන්නාවූ තැනැත්තෝ අතරමගදී බෝධිසත්වයන් දැක භික්ෂා පාත්‍රය දැක ගෙණ බෝධිසත්වයන් වහනසේ පවරා තමන්ගේ ගෙට ගෙණවුත් රසමසවුලෙන් යුක්තව භෝජනය බෝධිසත්වයන් වහන්සේට වළඳවා සිටානෝ කියන්නාහූ ස්වාමිනි, මාගේ ගෙට සිඟා ආ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක්ද දුගි මගී යාචකකෙණෙක්ද දන් නොගෙණ ගිය විරු කෙණෙක් නැත. නුඹ වහන්සේ වඩනට පළමුවෙන් මම රාජ්‍යසේවයට පලාගියෙමි යන  මම එක්කෙණෙකුන්ට සම්මත කොටලා නොගියෙමි. එසේ හෙයින් නුඹ වහන්සේ දුටු කෙණෙක් නැත. එසේ හෙයින් ඒ වැරුද්ද මා කෙරේමය සමාකර මැනවැයි සිටානෝ කීහ.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු සිටානෙනි තොප කෙරේ අප කෝප වූයේ නැත. වෛෂවුයේත් නැත. අප ඇසූ නියාවට මෙ කියන සිටානන්ගෙන් මෙවිතරදැයි සිතූ පමණන් විනා අප වික්ෂේප වූයේ නැතැයි කීහ.

එවිට සිටානෝ කියන්නාහූ මගේ දෙමව්පිය මුතුන් මීමුතුන් පරම්පරාවෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල ආදර සම්භාවනාවෙන් සතරපසයෙන් දන්දී දෙමව්පියන් දුටුයේ ආදර භක්ති ඇත්තාහ. මේ මාගේ අඩුවෙක් වූයේ යයි කීහ.

යහපතැයි බෝධිසත්වයෝ සිටානන්ගේ ආරාධනාවෙන් උන්ගේ ගෙයි කීපදවසක් රදා තමන් පළමු වාසය කළ හිමාලය වනයට ගොස් පංචාභිඥාෂ්ට සමාපත්ති උපදවා බඹලොව උපන්හයි වදාරා මේ පීඨ ජාතකය නිමවා වදාළසේක.